

# ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය

## පුරප්පාඩු



ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ පුරප්පාඩුව පවතින පහත සඳහන් තනතුර සඳහා සුදුසුකම් ඇති අපේක්ෂකයින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**(1) පශ්චාත් මරණ පරීක්ෂණ කම්කරු III ශ්‍රේණිය**

**සුදුසුකම් :** 1) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයට පෙනී සිට තිබිය යුතු වේ.

**වැටුප් පරිමාණය :** රු. 42,775 - 10x450; 10x490; 10x540; 12x640 - 65,255 (මාසික)
U-PL 1 – 2025
(මෙයට අමතරව රජය හා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත දීමනා ද ගෙවනු ලැබේ. විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල, විශ්වවිද්‍යාල විශ්‍රාම වැටුප් අරමුදල හා සේවා නියුක්තයින්ගේ භාර අරමුදල යන ඒවායේ ආයකත්වය හිමි වේ.)

**වයස :** අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට අවුරුදු 18 ට වැඩි විය යුතු අතර 45 ට නොවැඩි විය යුතු ය.

**සටහන :** අයදුම්කරුවන්; ශ්‍රී ලාංකික පුරවැසියන් විය යුතු ය. දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට සහ තනතුරේ රාජකාරි හොඳින් ඉටු කිරීමට ශාරීරිකව හා මානසිකව යෝග්‍ය විය යුතු ය. විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතු ය.

**බඳවාගනු ලබන ආකාරය :** වෘත්තීය පරීක්ෂණයක් හා/හෝ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මඟිනි.

**අයදුම්පත් ඉදිරිපත් කළ යුතු ආකාරය :**

මේ සඳහා වන අයදුම්පත් කාර්යාල දිනවල පෙරවරු 9.00 සිට පස්වරු 4.00 දක්වා ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ කුලියාපිටිය පරිශ්‍රයේ අනධ්‍යයන ආයතන අංශය වෙත පැමිණ ලබා ගත හැකි අතර **www.wyb.ac.lk** යන වෙබ් අඩවියට පිවිසීමෙන් ද ලබා ගත හැකි ය.

නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත් 2025 ජූනි මස 25 වැනි දින හෝ ඊට ප්‍රථමයෙන් ලැබෙන සේ නියෝජ්‍ය ලේඛකාධිකාරි, අනධ්‍යයන ආයතන අංශය, ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය, කුලියාපිටිය යන ලිපිනයට ලියාපදිංචි කළ තැපෑලෙන් එවිය යුතු ය. අදාළ සුදුසුකම් සනාථ කිරීම සඳහා වන සහතිකවල සත්‍ය පිටපත් බවට සහතික කළ ඡායා පිටපත් පමණක් අයදුම්පත්‍රය සමඟ අමුණා එවිය යුතු අතර අයදුම්පත බහාලන කවරයේ වම් පස ඉහළ කෙළවරෙහි ඉල්ලුම් කරන තනතුර පැහැදිලිව සඳහන් කළ යුතු ය. උසස් අධ්‍යාපන ආයතන, රාජ්‍ය දෙපාර්තමේන්තු, සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩලවල දැනට සේවය කරන අයදුම්කරුවන් තම අයදුම්පත් අදාළ ආයතන ප්‍රධානීන් මාර්ගයෙන් එවිය යුතු ය.

ලේඛකාධිකාරි
ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය
2025-06-09 වන දින